**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 1423 /2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி
දිනය / Date — 14/11/2023 පැය 1600

# මාධ්‍ය නිවේදනය

## 01. කොරියාව රටේ රැකියා ලබාදෙන බවට පවසා මුදල් ලබාගෙන වංචා කල සැකකාරියක් අත්අඩංගුවට - විශේෂ අපරාධ විමර්ශන අංශය මීගමුව.

2023.11.13 වන දින මීගමුව විශේෂ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් කොරියාව රටේ රැකියා ලබාදෙන බවට පවසා මුදල් රුපියල් 2,643,000/= ක මුදලක් ලබාගෙන වංචා කිරීම සම්බන්ධයෙන් සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට සැකකාරිය වයස අවුරුදු 57 ක් වූ නුගවෙල ලිපිනයේ පදිංචිකාරියක් වේ.**

මේ සම්බන්ධයෙන් මීගමුව විශේෂ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද පැමිණිලි මත විමර්ශන ආරම්භ කර සැකකාරිය අත්අඩංගුවට ගෙන ඇති අතර ඉදිරි විමර්ශන විශේෂ අපරාධ විමර්ශන අංශය විසින් සිදු කරනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - ඕපනායක පොලිස් වසම

2023.11.13 වන දින රාත්‍රී කාලයේදී ඕපනායක පොලිස් වසමේ හල්ලින්න, ඕපනායක ප්‍රදේශයේ පුද්ගලයෙකුට පහරදීමක් හේතුවෙන් තුවාල ලබා කහවත්ත රෝහලට ඇතුලත් කර සිටියදී, අද දින මියගොස් ඇති බවට කහවත්ත රෝහල් පොලිසියෙන් ලද පණිවිඩයක් මත ඕපනායක පොලීසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වූ හල්ලින්න, ඕපනායක ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** මෘත ශරිරය කහවත්ත රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත.

මෙම මරණකරු තම බිරිඳ සහ පුතා සමඟ ඉහත ලිපිනයේ පදිංචිව සිටින අතර පුතා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයෙකු වන අතර මොහු නිතර දෙමාපියන්ගෙන් මුදල් ඉල්ලා ආරවුල් ඇති කරගන්නා බවත්, 2023.11.13 වන දින රාත්‍රී කාලයේ මුදල් ඉල්ලා සිටියදි ඇති වූ ආරවුලක් හේතුවෙන් පුතා විසින් පියාට පොල්ලකින්

පහරදී තුවාල ලබා මෙලෙස රෝහල් ගතකර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

වයස අවුරුදු 28 ක් වූ සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇති අතර මොහු අත්අඩංගුවට ගැනීම සඳහා ඕපනායක පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.